සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය
## නර්තනය

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 02 යි.**

● අංක 01සිට 20 තෙක් සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

1. දේශීය නර්තන සම්ප්‍රදායන්හි, පා සරඹ හා මණ්ඩි පද නර්තනය කර අවසානයේ නටනු ලබයි.
   1. කස්තිරම 2. හමාර පදය 3. මාත්‍රා පදය 4. හත්පදය

2. ගැට බෙරයේ දකුණු ඇසෙහි ආරක්ෂාව සඳහා භාවිත කොටස හඳුන්වන්නේ.......''
   1. සුරත් තට්ටුව 2. වලයම
   3. සුරප්පට්ටුව 4. වෙනිවර කැරැල්ල

3. මිනිස් චරිත නිරූපණයේදී, එය වඩාත් පහසු වන්නේ ඔවුන්ගේ
   1. වාසස්ථාන අධ්‍යයනයෙනි. 2. චර්යා ලක්ෂණ හඳුනා ගැනීමෙනි.
   3. ස්වාභාවික පරිසරය නිරීක්ෂණයෙනි. 4. වෘත්තීය ක්‍රියාකාරකම් නිරීක්ෂණයෙනි.

4. ''එපා කියන තැන තැන නො සිටිල්ලා''............................................ මෙම ගායනය.
   1. සවරම් කවියකි. 2. කඩතුරා කවියකි.
   3. පන් නෙළීමේ කවියකි. 4. ගොයම් කැපීමේ කවියකි.

5. නර්තනය හා බැඳි සම්ප්‍රදායික බෙර පද නිර්මාණය වී ඇත්තේ ..................................... මූලික වීමෙනි.
   1. ගර්භාක්ෂර 2. බීජාක්ෂර
   3. අවනද්ධාක්ෂර 4. ස්වරාක්ෂර

6. මිනිසාගේ මානසික, ශාරීරික, අධ්‍යාත්මික වශයෙන් වන සංවර්ධනය ......................... නමින් හැඳින්වේ.
   1. චිත්තවේග සමබරතාව 2. අන්තර් පුද්ගල සබඳතා
   3. ස්වස්ථතාව 4. නම්‍යශීලිත්වය

7. නිර්මාණාත්මක වාදන අංගයක් සැකසීමේදී සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ මෙන්ම .................. වාද්‍ය උපකරණ ද භාවිතා කළ හැකි ය.
   1. අවනද්ධ 2. තාල
   3. විකල්ප 4. දේශීය

8. ඒ වත්ත මේ වත්ත තේ වත්ත යන රබන් පදය ............................................. තාල රූපය අනුව වාදනය කළ හැකිය.
   1. මාත්‍රා 2 + 3 2. මාත්‍රා 2 + 4
   3. මාත්‍රා 3 + 3 4. මාත්‍රා 4 + 4

9. ''උඩරට නැටුම් කලාව'' කෘතිය රචනා කරන ලද්දේ ................................................................... මහතා විසිනි.
   1. එස්. පණීභාරත 2. හීන් නිලමේ ගුරුතුමා
   3. ජේ. ඊ. සේදරමන් 4. එම්. එම්. ගෝමිස් මහතා

10. දේශීය වාද්‍ය භාණ්ඩ අතුරෙන් හේවිසි වාදනය සඳහා යොදා ගනු ලබන වාදන භාණ්ඩ වන්නේ,

1. ගැටබෙරය, දවුල, හා හොරණෑව
2. දවුල, තම්මැට්ටම හා හොරණෑව
3. තම්මැට්ටම, උඩැක්කිය හා හොරණෑව
4. රබාන, දවුල හා හොරණෑව

♦ **අංක 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා හරිනම් ( √) ලකුණ ද වැරදිනම් (x) ලකුණ ද යොදන්න.**

11. මණ්ඩියේදී දෙපා අතර දුර ප්‍රමාණය මිටි රියනකි. (   )


12. ගොයම් කැපීමේ නැටුම සඳහා බුම්මැඩිය යොදා නොගැනේ. (   )

13. නර්තන කලා ඉතිහාසය අධ්‍යයනයේදී මූලාශ්‍ර වැදගත් නොවේ. (   )

14. තාන්ජාවූර් සහෝදරයන් භරත නැටුම් සංවර්ධනයේ පුරෝගාමීන් වේ. (   )

15. මවක් තම පුතු මිය ගිය බව දැක වැලපීමෙන් භය නමැති ස්ථායීභාවය නිරූපණය වේ. (   )

● **16 - 20 දක්වා පහත ප්‍රහේලිකාව ඇසුරෙන් පිළිතුරු ලියන්න.**




16. A හරහට - විකල්ප වාද්‍ය උපකරණයකි.
17. B හරහට - තාලයේ වේගය වේ.
18. A පහළට - අණබෙර හා හේවිසි වාදනය සඳහා යොදා ගනී.
19. C පහළට - උඩ, මැද හා පහළ ලෙස අවකාශයේදී භාවිත වේ.
20. D පහළට - කමත් භාෂාවේදී කුල්ල සඳහා ව්‍යවහාර වේ. (2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. 1. සාම්ප්‍රදායික වන්නම් නර්තනයේදී ...................................... චලන ඇසුරු කර ගනී.

2. සාම්ප්‍රදායික මිණුම් ක්‍රම අනුව අතමිට මොලවා මාපටඟිල්ල හා දබරගිල්ල දිගු කිරීමෙන් ලැබෙන දිග ප්‍රමාණය .......................................... නම් වේ.

3. ''තහලම් කළ බෙර ''යන කවිය ගම්පොළ යුගයේ රචිත .................................................... සංදේශයේ ඇතුලත් වේ.

4. අතීතයේදී පා සරඹ පුහුණුව සඳහා යොදා ගත් ආධාරකය ....................................... ලෙස හැඳින්වේ.

5. ශ්‍රී ලාංකික ජන සමාජයේ දෙවියන්, යකුන් හා ග්‍රහයින්ගෙන් සෙත් ශාන්තිය පතා .......................................................... පවත්වනු ලැබේ.

6. ........................................................... වන්නම මාත්‍රා 4 + 4 තාලයට නටනු ලබයි.

7. පූර්ව චාරිත්‍රයක් ලෙස, නියමිත කාලසීමාවක් තුල යාගයක් පවත්වන බවට දෙවියන්ට භාරවනු වස් ............................... චාරිත්‍රය සිදු කරයි.

8. ද්‍රවිඩ ජනතාව විසින් මහත් භක්තියෙන් දින නවයක් පුරා රාත්‍රී කාලයේ ........................................................................... උත්සවය පවත්වනු ලබයි.

9. තාලය හා බැඳි ලය ගුණ කිරීමේ ක්‍රියාවලියේදී සමගුණ හා දෙගුණ අර්ථ දක්වන්න ............................................

   i. සමගුණ -......................................................  ii. දෙගුණ -..................................................................

10. ස්වස්ථාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක වන්නේ

   i. .....................................................................  ii. ...............................................................................

1 - 8 = ලකුණු 08

9 - 10 = ලකුණු 04

(මුළු ලකුණු 12)

2. 1 දෙතිතේ තාල ප්‍රභේද දක්වන්න.

2. මාත්‍රා 2 + 3 තාල රූපයට බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.

3. සිංහරාජ වන්නම/ අනුරාග දණ්ඩ තාලය/ විරාඩි වන්නමට අයත් කවිපද දෙකක් ප්‍රස්ථාර කරන්න.

3. 1. නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කළ හැකි මිනිස් චරිත හතරක් ලියන්න.

2. චරිත නිර්මාණයට සුදුසු සිද්ධියක් එක් චරිතයක් ඇසුරින් ගොඩනගන්න.

3. නර්තනයෙන් චරිත නිර්මාණය කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් දක්වන්න.

4. 1. දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න.

2. ගැටබෙරයේ වාදන අවස්ථා, මිම් ප්‍රමාණ, අමුද්‍රව්‍ය ඇසුරු කොට කෙටි විස්තරයක් කරන්න.

3. ගැටබෙරයක රූප සටහනක් ඇඳ කොටස් පහක් නම් කරන්න.

5. 1. ගැමි නැටුම් යන්න කෙටියෙන් හඳුන්වන්න.

2. ගොයම් කැපීමේ / පන් නෙළීමේ නැටුමට අයත් කවියක් ලියන්න.

3. ඉහත එක් ගැමි නැටුමක සංස්කෘතික පසුබිම විස්තර කරන්න.

6. 1. නර්තන කලා ඉතිහාසය පිළිබඳ තොරතුරු දක්වෙන සෙල්ලිපි දෙකක් නම් කරන්න.

2. ඉන් එක් සෙල්ලිපියක් ඇසුරු කර නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විස්තර කරන්න.

3. කෝට්ටේ යුගයේ නර්තනය පිළිබඳ සංදේශ කාව්‍යකින් සාධකයක් දක්වන්න.

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය

## නර්තනය - පිළිතුරු පත්‍රය

### i කොටස

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 6 - 3 | 11 - √ | 16. දඬු බෙරය |
| 2 - 1 | 7 - 3 | 12 - x | 17. ලය |
| 3 - 2 | 8 - 1 | 13 - x | 18. දවුල |
| 4 - 4 | 9 - 3 | 14 - √ | 19. තල |
| 5 - 2 | 10 - 2 | 15 - x | 20. යතුර |

(ලකුණු 20 x 2 = 40)

### II කොටස

01.
1. තාලානුකූල
2. විග්ගුස්ස
3. තිසර
4. දණ්ඩිකද
5. ශාන්තිකර්ම
6. සිංහරාජ/ අනුරාග දණ්ඩ/ විරාඩි
7. කප් සිටුවීම
8. නවරාත්‍රී උත්සවය
9. i. විලම්භ ලය ii. මධ්‍ය ලය
10. i. මානසික සාධක ii. කායික සාධක

02. 1. සුළු මැදුම් දෙතිත $\hat{1}2 \mid \acute{1}\ 2\ 3$

සුළු මහ දෙතිත $\hat{1}2 \mid 1\ \acute{2}\ 3\ 4$

මැදුම් මහ දෙතිත $\hat{1}\ 2\ 3 \mid \acute{1}\ 2\ 3\ 4$ (ලකුණු 03)

2. විභාග, තාල සංකේත භාවිතය - ලකුණු 02
බෙර පදය ප්‍රස්ථාර කිරීම - ලකුණු 02 (ලකුණු 04)

3. විභාග, තාල සංකේත භාවිතය - ලකුණු 02
කවි පද දෙකක් ප්‍රස්ථාර කිරීම - ලකුණු 03 (ලකුණු 05)

03. 1. රජතුමා, වැද්දා, ධීවරයා, තේ දළු නෙලන්නී........ ආදී වශයෙන් නිවැරදිව දැක්වීම (ලකුණු 04)

2. සිද්ධියක් ගොඩ නගා තිබීම - (ලකුණු 04)

3. i. පරිසරය නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කිරීම.
ii. විවිධ ජීවන වෘත්තීන් පිළිබඳ අවධානය යොමු කිරීම.
iii. නර්තන මාධ්‍යයෙන් චරිත නිරූපණය කිරීම.
iv. තාලය, රිද්මය හා ප්‍රකාශනය කෙරෙහි අවධානය යොමු කිරීම.
v. භාවමය හැඟීම් උද්දීපනය වන සේ නර්තන නිර්මාණය
vi. චලනය හා අවකාශය පිළිබඳ අවබෝධය
vii. උචිත පරිදි නිර්මාණාත්මකව බෙර වාදනය යොදා ගැනීම. (ලකුණු - 04)

04. 1.
- උඩරට සම්ප්‍රදාය - ගැටබෙරය
- පහතරට සම්ප්‍රදාය - යක්බෙරය/ දෙවොල් බෙරය / පහතරට බෙරය
- සබරගමු -සම්ප්‍රදාය - දවුල

(ලකුණු 03)

2.
- ආගමික අවස්ථා - පිරිත් පිංකම/ පෙරහැර/ තේවා වාදන.....
- සමාජීය අවස්ථා - ශාන්තිකර්ම, උත්සව, සංදර්ශන, තූර්ය වාදන, සමාරම්භක අවස්ථා

- මිම් ප්‍රමාණ - තුන් වියන් තුන අඟුලකි (දිග ප්‍රමාණය)
  විග්ගුස්සකි / අඟල් 7 -8 (බෙර ඇස)

- අමු ද්‍රව්‍ය - දැව වර්ග - කොහොඹ, ඇසල, කොස්, ගංසූරිය
  සම් වර්ග - වඳුරු, මුව, තලගොයි, හරක්, එළු සම් වර්ග
  පිත්තල (ගිගිරි වළල්ල) (ලකුණු 04)

3. ගැටබෙරය රූප සටහන නිවැරදිව ඇඳ දැක්වීම - (ලකුණු 02)
   කොටස් නම් කිරීම - (ලකුණු 03) = ලකුණු 05

5. 1. ගැමි නැටුම යන්න සරලව හැඳින්වීම, ගැමි නැටුම් නම් කිරීම, ගැමි නැටුමේ ලක්ෂණ කෙටියෙන් විස්තර දැක්වීම (ලකුණු 04)
   2. ගොයම් කැපීම - රන්දෑකැති ගෙන.......
      ඉරු දෙවියන්ගේ......
      උදේ සිටන්.....
      එපා කියන....... වෙනත් අදාල ඕනෑම ගොයම් කවියක් (ලකුණු 04)
      පන් නෙළීම - ගාන තෙල් සඳුන්.....
   3. ගොයම් කැපීම/ පන් නෙළීම නැටුමක මූලික ලක්ෂණ සංස්කෘතික පසුබිම විස්තර කිරීම.
      (ලකුණු 04)

6. 1. කොරවක් ගල් ලෙන් ලිපිය/ සැස්සේරුව සෙල් ලිපිය/ පාල මොට්ටායි සෙල්ලිපිය (ලකුණු 02)
   2. තෝරාගත් සෙල්ලිපිය ඇසුරු කර නර්තන කලාවේ ඓතිහාසික පසුබිම, සමාජයීය වටිනාකම විස්තර කිරීම. (ලකුණු 02)

      උදා :- පාලමොට්ටායි සෙල් ලිපිය
      - දේවාල ආශ්‍රිත නැටුම් පැවති බව.
      - පූජාත්මක නර්තන පැවති බව
      - කාන්තාවන් නර්තනයට දායක වූ බව
      - දේවදාසී ක්‍රමය ලක්දිව ක්‍රියාත්මක වූ බව
      - දේශීය නර්තනයට භාරතීය ආභාසය හිමි වූ බව
      - දියුණු මූර්ති කලාවත් පැවති බව

      සාධකය - ලකුණු 02
      විස්තරය - ලකුණු 02
   3. - ලෙලෙනා දිගු නෙත - පරවි සංදේශය
      - විදෙන ලෙලෙන - නරුබර - සැළලිහිණි සංදේශය
      - ලකල පුළුලුකුල - සැළලිහිණි සංදේශය
      - ලෙලදුන් නව තඹ - පරවි සංදේශය (ලකුණු 04)